**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 28 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6 .1 (අ) ඡේදයේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**මූල්‍ය නොවන වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් 09 ක අවසන් ශේෂයන්, 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව (SA 82) එකී වත්කම්වල ආරම්භක ශේෂ එකතුව සමඟ සැසඳීමේදී රු.260,038,390 ක ශුද්ධ නොසැසඳුණු වෙනසක් නිරීක්ෂණය විය. | SA 82 වාර්තාව අනුව ආරම්භක ශේෂ සහ වර්ෂය තුල හර කිරීම් සහ බැර කිරීම්ද වැරදි අගයන් වන අතර මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර 2024 වර්ෂය තුලදී එම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත්කල යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණනයට ඉදිරිපත් කරන ලැබූ මූල්‍ය ප්‍රකාශන සමග වූ මූල්‍ය නොවන වත්කම් වාර්තාවට (SA 82) අනුව සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය නොවන වත්කම් උපලේඛනයට අනුව ස්ථාවර වත්කම්වල ආරම්භක ශේෂයන්, ආරම්භක ශේෂ සඳහා වූ ගැලපුම්, මිලදී ගැනීම් සහ ඉවත් කිරීම් වල අවසන් ශේෂයන් අතර පිළිවෙලින් එකතුව රු.3,504,000, රු.59,000,000, රු.8,474,258 හා රු.234,447,532 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | මෙම ගැලපීම් සිදුකර ඇත්තේ SA82 වාර්තාව නිවැරදි සේ සලකා ඒ සමඟ තුලනය කිරීම සඳහා වුවද SA82 වාර්තාව නිවැරදී නොවන බැවින් මෙම ගැලපීම නිවැරදි නොවන බව.මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් වාචිකව ලැබුනු උපදෙස් පිරිදි 2024 වර්ෂයේදී මාරුපත්‍ර මඟින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත්කල යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රීලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(4) | රජයේ දේපලකට සිදුවූ පාඩුවක් හෝ අලාභහානියක් සම්බන්ධයෙන්, අලාභහානිය සිදුවූ දිනයේ සිට තුන්මසක් ඇතුලතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ වාහන තුනකට (03) සිදුවූ අනතුරු සම්බන්ධයෙන් වූ වාර්තා මෙම වාර්තාවේ දිනවන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබා දෙන මෙන් දැනුම් දී ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | 2019 මැයි 31 දිනැති අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මීල්ලනිය, මතුගම, බේරුවල, දොඩන්ගොඩ හා මදුරාවල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි විශ්‍රාම වැටුප් ලිපි ගොනු 261 ක් 2023 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 මැයි 30 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06 ඡේදය | මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය යාවත්කාලීන නොකිරීම මත මතුගම, බේරුවල, දොඩංගොඩ හා බුලත්සිංහල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2023දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් 18 දෙනෙකු වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් කර තවදුරටත් අයකර ගත යුතු රු.613,072 ක මුදලක් පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ IV උප ඡේදය හා අංක 02/2021 (VIII) දරන 2023 මැයි 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමෙන් පසු නිලධාරීන්ගේ අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී දීමනා ගෙවීම් කළ යුතු වුවද, බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය සිය පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා භාවිතා නොකර එකී කාල සීමා සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් ලබාගෙන තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා එසේ නොකල නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූලව කටයුතු කළ යුතුය. |

## 2.2 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට, පොදු තැන්පත් ගිණුම් 6 ක එකතුව රු.205,871,887 ක ශේෂයක් පැවති අතර ඒ අතුරින් පොදු තැන්පත් ගිණුම් 5 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් කර නොතිබූ එකතුව රු. 47,692,035 ක තැන්පතු ශේෂයක් නිරීක්ෂණය විය. එසේම එකී ශේෂය තුල එකතුව රු.2,989,956 ක් වූ වසර 5 ක් ඉක්ම වූ තැන්පතු ද පැවතුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැන්පත් ගිණුමේ වසර දෙකකට වැඩියෙන් පවතින අක් මුදල් නොමැති බැවින් ගෙවා නොමැති තැන්පතු මෙම වසර තුල අක් මුදල් ලද සැනින් ගෙවන බව හා නිරවුල් නොවූ තැන්පතු මෙම වසරේ නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | කල් ඉකුත් වූ තැන්පතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද එහි 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව ඇතුළත් විය යුතු විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර නොතිබුණු අතරම චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙතින් අනුමතකරවාගෙනද නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව විස්තරාත්මකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට හා අනුමත කර ගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කිරීමට සටහන් තබා ගන්නා ලද බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ජාතික ආහාර වැඩසටහන යටතේ ආහාර විජලන යන්ත්‍රයක් හා ද්‍රව්‍ය කුඩුකිරීමේ යන්ත්‍රයක් මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණ ද එකී යන්ත්‍රවල වටිනාකම සනාථ කරන ලිපි විගණනයට | මෙම යන්ත්‍ර 2017 වර්ෂයේ මිලදීගෙන තිබුණ ද මේවා ස්ථානගත කිරීමට ගොඩනැගිල්ලක් නොපැවතීම ප්‍රධාන ගැටලුවක් වී තිබුනු බව. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් නොවීය. කෙසේ වුවද එම යන්ත්‍ර ස්ථාපනය කිරීම සඳහා ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ලැබුණු රු.1,000,000 ක ප්‍රතිපාදන වැයකර 2019 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු අතර, එම යන්ත්‍ර 02 ක ස්ථාපනය සඳහාම ඉදිකරන ලද එම ගොඩනැගිල්ලට විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණු හෙයින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 05 කට අධික කාලයක් මෙම යන්ත්‍ර 02 නිෂ්කාර්යව පැවතී තිබුණි. | මෙම උපකරණ ස්ථානගතකර නිෂ්පාදන ආරම්භ කිරීමට ගොඩනැගිලි ඉදිකිරීම අත්‍යවශ්‍ය වූ බැවින් රු.1,000.000 ක මුදලක් අනුමත කර ඇති නමුත් එම මුදල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ගොඩනැගිල්ල ඉදිකර වහල ගැසීම පමණක් සිදු කර ඇති බව. එහිදී යන්ත්‍රය සුරක්ෂිත කර ගැනීම පළමු අරමුණ වී ඇති බැවින් විදුලිය ලබා ගැනීම හා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ දෙවන අදියර වශයෙන් අවසන් කිරීමට අපේක්ෂා කර ඇති බව. | යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වෙන්කරනු ලැබූ රු.250,000 ක ප්‍රතිපාදන මත මගුර පරකැටිවල ග්‍රාමයේ ප්‍රජා ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.244,550 ක් වැයකර තිබුණ ද වසර 2 කටත් අධික කාලයක් තිස්සේ යෝජිත ව්‍යාපෘතිය ඉටුකිරීමකින් තොරව නිශ්කාර්යව පැවති නමුත් මේ පිළිබඳ වගකිව යුතු පාර්ශවයක් විසින් කිසිදු පසු විපරමක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද එම ව්‍යාපෘතිය පිළිබඳ ස්ථානීය පරීක්ෂණයේදී මිලදී ගත් නල නොමැතිව වෙනත් ප්‍රමාණවල නල ප්‍රජාමූල සංවිධානයේ හිටපු ලේකම්වරයාගේ නිවසේ ගබඩා කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | වගකිවයුත්තන්ගෙන් කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | කිතුල් කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය කිරීම අරබයා කිතුල් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ධීවර ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ "කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය - 2018" ප්‍රතිපාදන මඟින් රු.500,000 ක් වැය කොට ඉදිකල අලෙවිසැලක් 2020 සැප්තැම්බර් 02 වන දින සිට අවබෝධතා ගිවිසුමක් මඟින් පාලින්දනුවර ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණි. කෙසේ වුවද මෙම කිතුල් අලෙවි මධ්‍යස්ථානය වසර 2 ක පමණ කාලයක සිට වසා දමා ඇති බවත් වර්තමානයේ දී කිසිදු අලෙවි කටයුත්තක් සිදුනොකර එය නිශ්කාර්යව පැවතුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | වගකිවයුත්තන්ගෙන් කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මත කළුතර දිස්ත්‍රික්කය සඳහා සුව බොජුන්හලක් මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මතුගම ප්‍රජාමූල බැංකුවට යාබද ඉඩමේ රු.4,493,830 ක වියදමක් දරා ඉදිකර 2023 පෙබරවාරි මස 05 දින වැඩ අවසන් කර තිබූ නමුත් මෙම ගොඩනැගිල්ල නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඉදිකිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් විගණිත දිනය වූ 2023 ජූලි 27 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි. සුව බොජුන්හල හා අලෙවි මධ්‍යස්ථාන ඉදි කරන ඉඩම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරාගත හැකි ඉඩමක් විය යුතු ලෙසට සමෘද්ධි සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණද මතුගම ඉදිකල සුව බොජුන්හල පිහිටි ඉඩම මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු විය. ජල හා වැසිකිලි පහසුකම් ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් සුව බොජුන්හල විවෘත කිරීමට නොහැකි වී තිබුණි. | ජල හා වැසිකිලි පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෙම බොජුන් හල විවෘත කිරීමට නොහැකි වී ඇති අතර අවශ්‍ය ප්‍රධාන සාධක සපුරා ගත් පසු මෙම බොජුන් හල විවෘත කිරීමට අවස්ථාව ඇති බව. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතුය. |

## 3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.4,788,488 ක් වැයකර මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදනයන් බිහිකිරීමේ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ දී, 2019 වර්ෂයේදී රු.1,000,000 ක ග්‍රාම ශක්ති ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබුණු පෙර පැවති ගොඩනැගිල්ලේ රු.291,237 ක පිරිවැයකින් ඉදිකර තිබුණු වහලය ගලවා ඉවත් කර තිබුණු නමුත් එම ගලවා ඉවත් කරන ලද වහලයේ ඉවත් කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය කිසිවක් සෞභාග්‍යා සමිතිය වෙත හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විධිමත්ව භාරදී නොතිබුණි. පැවති වහලයෙන් ගලවා ඉවත් කල ගොඩනැගිලි ද්‍රව්‍ය තැනින් තැන ගොඩගසා තිබූ අතර, ඇස්තමේන්තුවේ ඇතුලත් වූ පළමු මහල සඳහා වන පඩිපෙල ඉදිකර නොතිබීම නිසා ඒ හා සම්බන්ධිත ගඩොල් බිත්තිය හා කොළම් (columns) වැස්සට නිරාවරණය වී තිබීම හේතුවෙන් ඒ පස ඇති ජනේලයෙන් වතුර ඇතුලට කාන්දු වෙමින් පැවතුණි. ගොඩනැගිල්ලේ පළමු මහළ ඉදිකිරීම් නිම නොකර ඉතිරි කර ඇති කොළම්වල (columns) කම්බි සහ පඩිපෙල සඳහා ඉතිරි කර ඇති කම්බි පරිසරයට නිරාවරණය වී මළ බැඳෙමින් පැවතුණි. එම | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගික ව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය. |

ගොඩනැගිල්ලේ වැරන්ඩාවේ වහලය ඉදිකර නොතිබීම හේතුවෙන් වැරන්ඩාවේ ඉදිකර තිබූ අඩි 09 ක් උස කොළම් 3 ක් හා ඉදිකර තිබූ බිම සිමෙන්තිය (rendering) අව් - වැසි වලට නිරාවරණය වී පැවතුණි. මූලිකව ඇස්තමේන්තු ගත කර තිබූ ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන සැකසීමේදී අනිවාර්යයෙන්ම එම අමුද්‍රව්‍ය (ගොටුකොළ) සෝදා පිරිසිදු කිරීම සඳහා අවශ්‍ය වන සේදුම් බේසම් (සින්ක්) සවිකර නොතිබුණි. මෙම ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන බිහිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු ළඟා කර ගැනීම සඳහා එම නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබාගත යුතුවූ අතර එම තත්ත්ව සහතික ලබාගැනීම සඳහා සුදුසු (යහපත්) නිෂ්පාදන ක්‍රියාවලියක් (Good Manufacturing Practice) ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය නිර්නායක සපුරාලමින් එම කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර නොතිබුණි.

(ආ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.8,723,174ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණු ගොටුකොළ ආශ්‍රිත නිෂ්පාදිත සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, 2017 වර්ෂයේ දී ජාතික ආහාර වැඩසටහන යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලැබී එහෙත් වසර 05 ක් තිස්සේ භාවිතා කර නොතිබුණු, වටිනාකම විගණනයට ඉදිරිපත් නොවූ ආහාර විජලන යන්ත්‍රයක් හා ද්‍රව්‍ය කුඩුකිරීමේ යන්ත්‍රයක්ද ලබාදී තිබුණි. එම ව්‍යාපෘතියේ නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබාගැනීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් ලෙස දක්වා තිබුණ ද ඒ සඳහා සපුරාලිය යුතු භෞතික අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබීම මත, එම තත්ත්ව සහතිකය ලබාගත නොහැකි වීම හේතුවෙන් නිෂ්පාදන, විදේශීය වෙළඳ පොලට මෙන්ම දේශීය වෙළඳපොලටද ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. එම සහතික ඉදිරියේදී හෝ ලබාගැනීමට සුදුසු නිෂ්පාදනාගාර පරිසරයක් මෙහි නිරීක්ෂණය නොවීය. මෙම ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යාපෘතියේ නිෂ්පාදනයන් වර්තමානයේදී තාවකාලිකව නවතා දමා තිබුණු අතර, ඒ අනුව ක්‍රියාත්මක කර තිබුණු ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගත නොහැකිවී තිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගික ව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| (ii) සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ රු.1,778,000 ක පිරිවැයකින් දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කළ බතික් ආශ්‍රිත නිර්මාණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ බතික් කර්මාන්තය සඳහා අත්‍යාවශ්‍ය වන භූමිතෙල් ලිප්, කතුරු, යනාදී මූලික නිෂ්පාදන උපකරණද ප්‍රතිලාභීන් වෙත ලබාදීමට ඇස්තමේන්තු කර තිබුණද එම උපකරණ ලබාදීමට කටයුතු කර නොතිබූ නමුදු බතික් කර්මාන්තයේ අවසන් නිමවුමක් ලබාගැනීම සම්බන්ධව අවසන් අදියරේදී භාවිතා කල යුතු අත්‍යාවශ්‍ය උපකරණයක් නොවන නූල් 5 ඕවර් ලොක් මැෂින් 20 ක් මිලදී ගෙන ප්‍රතිලාභීන් වෙත ලබාදීම වෙනුවෙන් පමණක් රු. 1,778,000 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතිය සම්බන්දයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී විගණිත දිනය වන විට ප්‍රතිලාභීන් දැනට ඉතාමත් සුළු වශයෙන් නිෂ්පාදන කටයුතු වල නිරත වන බවද තහවුරු විය. එසේ වුවද මැෂින් 20 ක් ලබාදී තිබූ නමුත්එම ප්‍රතිලාභීන් අතරින් බතික් කර්මාන්තයේ දී ඩයි කිරීම සඳහා අවශ්‍ය කරන බාත් ටබ් සතුව තිබුණේ ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත පමණක් බැවින් විධිමත් අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය සැලසුම් කිරිම නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය. |
| (iii) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ පිරිවැය රු.2,768,868 කින් ක්‍රියාත්මක කල එක් ව්‍යාපෘතියක් වූ බට පැළලි නිෂ්පාදනකරුවන් සඳහා සම්බන්ධීකරණ හා අලෙවි මධ්‍යස්ථානයක් සඳහා වූ ගොඩනැගිල්ලක ඉදිකිරීම් නිම කර වසර 02 කටත් අධික කාලයක් ගතවී තිබුණ ද විගණිත දිනය වූ 2024 ජනවාරි 19 දින වන විටත්, අදාළ ගොඩනැගිල්ල අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගික ව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය. |
| (iv) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරිම සඳහා ප්‍රතිලාභීන් 72 දෙනෙකු වෙත රු.6,492,054 ක් වටිනා මල් පෝච්චි අච්චු, සෙවිලි තහඩු සහ GI බටද ලබාදී තිබුණ ද ක්‍රියාත්මක කර තිබුණු සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව ප්‍රතිලාභීන් 20දෙනෙකු පිලිබඳව විගණනය විසින් සිදුකරන ලද නියැදි ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 14 | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | ඌන උපයෝජිත උපකරණ හඳුනාගෙන උනන්දුවක් දක්වන්නන් වෙත ලබාදියුතු අතර උපකරණ ඌන උපයෝජනය සම්බන්දයෙන් වගකිවයුත්තන්ගෙන් කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | |
|---|---|---|
| දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.1,312,475 ක් වටිනා එම උපකරණ 2024 ජනවාරි 19 වන විගණිත දින වන විටත් ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබා දී ඇති ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳව නිරන්තර අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | | |
| (v) බුලත්සිංහල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ කාබනික පොහොර නිෂ්පාදනය කිරීම යටතේ රු.2,762,677 ක් වටිනා යන්ත්‍ර ඇතුළු උපකරණ ප්‍රදානයන් සිදුකිරීමේදී විධිමත් ගිවිසුම්ගත වීමකින් තොරව ඒවා ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබුණි. ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබාදී ඇති ද්‍රව්‍ය හා උපකරණ අදාල නිෂ්පාදන කර්මාන්තය වෙනුවෙන්ම යොදවන්නේද සහ ඒ තුළින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය මාර්ගය වැඩිදියුණු කරන්නේද යන්න පිළිබඳ නිරන්තර අධීක්ෂණයක් සිදුවන බවට ලිඛිත සාක්ෂියක් නොවීය. ඉහළ වටිනාකමකින් යුත් නිෂ්පාදන උපකරණ සමිතියේ පොදු පරිහරණය සඳහා ලබාදී ඇති අවස්ථාවල එම උපකරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොග ලේඛනයට ඇතුළත් කොට සෞභාග්‍යා සමිති භාරයට පත් කළ යුතු නමුත් උපකරණ ලබාදීමේදී එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. කොම්පෝස්ට් සැකසුම් මධ්‍යස්ථානයේ වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් විගණනය විසින් සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී, කාබනික පොහොර නිෂ්පාදන ගොඩනැගිල්ල තුල කිසිදු පොහොර නිෂ්පාදනයක් සිදු නොවන බවත් කාබනික පොහොර හැලීම සඳහා ලබාදී තිබුණු යන්ත්‍රය භාවිතා කර පිටතින් රැගෙන එන පොහොර හැලීම පමණක් සිදුකරන නමුත් එම යන්ත්‍රයද දීර්ඝ කාලයක සිට භාවිතා කර නොතිබුණු බවත් දක්නට ලැබුණි. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ලබා දී තිබූ අතු කැබලි කැපීමේ යන්ත්‍ර දෙකෙන්, එක් යන්ත්‍රයක් පමණක් දක්නට ලැබුණු අතර එම යන්ත්‍රයද දීර්ඝ කාලයක සිට භාවිත කර නොතිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදන පිළිබඳ වාර්තා කිසිවක් සමිතිය සතුව නොතිබුණු අතර, 2022 අගෝස්තු මාසයෙන් පසුව කිසිදු කාබනික පොහොර නිෂ්පාදනයක් සිදුව නොතිබුණි. ඒ අනුව ඉදිකළ කාබනික පොහොර සැකසුම් මධ්‍යස්ථානය හා එම මධ්‍යස්ථානය වෙත ලබාදී ඇති යන්ත්‍ර උපකරණද වසර 01 ½ කටත් වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවතීණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගික ව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මකර කර තිබූ අනෙක් ව්‍යාපෘතිය වූ කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් හතරක් (04) යටතේ රු.7,621,997 ක් වැයකර තිබුණ ද විගණිත දිනය වූ 2024 පෙබරවාරි 29 දක්වා එනම් වර්ෂ 2 ක් ඉක්මවා තිබුණ ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා තිබුණු කුරුඳු ප්‍රවර්ධනය කිරීමේ සෞභාග්‍යා සමිතිය බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. අදාල ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබාදී ඇති රු.1.126,991 වටිනා ද්‍රව්‍ය හා උපකරණ අදාල නිෂ්පාදන කර්මාන්තය වෙනුවෙන්ම යොදවන්නේද යන්න පිළිබඳ නිරන්තර අධීක්ෂණයක් සිදුවී නොතිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ තවත් ප්‍රතිලාභීන් දෙදෙනෙකු සඳහා කුරුඳු පැළ තවාන් ඇති කිරීම පිණිස රු.86,075 ක් වටිනා උපකරණ ලබාදී තිබුණද විගණනය විසින් සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී එලෙස පැළ තවාන් සකස් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය. |
| (vii) | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කුරුඳු වගාව හා අතුරු නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා රු.6,016,447 ක් වැය කර තිබුණු අතර, විගණනය විසින් සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී කුරුඳු තෙල් නිස්සාරණ කටයුතු 2022 ජූලි මාසයේ ආරම්භ කර අත්හදා බැලීම් පමණක් සිදුකර 2022 දෙසැම්බර් මස 14 දින සිට ප්‍රාදේශීය ලේකම් සමග වූ ගිවිසුමක් මගින් පෞද්ගලික පාර්ශවයක් වෙත කුරුඳු තෙල් නිස්සාරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ වගකීම පවරා තිබුණි. එතැන් සිට විගණිත දිනය දක්වා කුරුඳු තෙල් බෝතල් 14.5 ක් පමණක් නිෂ්පාදනය කර එයින් බෝතල් 3.5ක් පමණක් අලෙවිකරගත හැකිව තිබුණි. ව්‍යපෘති වාර්තාවට අනුව කුරුඳු ආශ්‍රිත අපේක්ෂිත අතුරු නිෂ්පාදනයන් 05 ක් දක්වා තිබූ නමුත් අදාල ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව අතුරු නිෂ්පාදන 02 ක් පමණක් සුලු වශයෙන් සිදු කරන නමුත් අනෙකුත් නිෂ්පාදන සඳහා කිසිවෙකු විගණිත දිනය දක්වා යොමු වී නොතිබුණි. | 2023 අගෝස්තු මාසයේ අග වනවිට කුරුඳු පොතු ගැලවීමට නොහැකි වන බැවින් කුරුඳු තැලීම තාවකාලිකව නතර කරන ලද අතර කුරුඳු පොහොර ඉතා මිළ අධික බැවින් ඇතැම් කුරුඳු ගොවීන් කුරුඳු කොළ පොහොර සඳහා යොදා ගෙන ඇති බව. එම නිසා ලැබෙන කොළ ප්‍රමාණය අඩුවී ඇති බව. ඉදිරියේදී කුරුඳු කැපෙන කාලය වනවිට අපේක්ෂිත කොළ ප්‍රමාණයක් ලබාගත හැකිවීමත්, පොහොර සඳහා යොදන කොළ සඳහා විකල්ප ක්‍රමයක් භාවිතා කිරීමට උපදෙස් ලබාදී ඇත. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගික ව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට ඉදිරිපත්වූ තොරතුරුවලට අනුව ගණනය කිරීමේ දෝෂ, වංචනික කටයුතු හෝ වෙනත් කරුණු මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක විශ්‍රාමිකයන් 35 දෙනෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවා ඇති මුදල රු.4,276,202 ක විය. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් නොපමාව අයකරගතයුතු අතර වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූලව කටයුතු කිරීම කල යුතුය. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 16 ක් සඳහා 2023 මැයි 06 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි. | 2023 වර්ෂයේ ආරම්භයේ සිට විගණන විමසුම් 108 ක් පැවති අතර මේ වන විට විගණන විමසුම් 92 ක් සඳහා පිළිතුරු සපයා ඇති බවත්, ඉතිරි 16 සඳහා හැකි ඉක්මනින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව. | විගණන විමසුම් සඳහා කාලීනව පිළිතුරු ලබාදී අදාල නිවැරදි කිරීම් කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර දිස්ත්‍රික්කයේ සිදුවූ ස්වභාවික ආපදාවලින් පූර්ණ හානියට පත් වූ සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කළ යුතු ලෙස හඳුනාගත් පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම පිණිස ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබූ ප්‍රතිපාදන සම්බන්දයෙන් නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරක ප්‍රතිලාභීන් 16 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.24,075,000 ක ප්‍රතිලාභ මුදල් මගින් මිලදීගත් ඉඩම්වල සහ නිවෙස්වල අයිතිය අදාල ප්‍රතිලාභීන් නමින් පවරාගෙන හෝ පවරාගත් බවට විගණිත දින වනවිටත් තහවුරු කරගෙන නොතිබුණි. තවද මේ යටතේ තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක (03) ප්‍රතිලාභීන් තිදෙනෙකු වෙත රු.4,600,000 ක් ගෙවා තිබූ නමුත් එම ප්‍රතිලාභීන් විසින් තමන් විසින් රජයේ අරමුදල් මගින් මිලදි ගත් නිවාස සහිත ඉඩම් පසුව වෙනත් පාර්ශවයන්ට විකුණා තිබුණ ද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි මේ. | ප්‍රතිලාභීන් වෙත නිදහස් කළ මුදල් අදාල කාර්යය සඳහා යොදවන බවට තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණයක් හා පසුවිපරමක් සිදුකළ යුතුය. එලෙස අදාල කාර්යය සඳහා යොදවා නොමැති මුදල් ආපසු රජයට අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ප්‍රතිලාභීන් 06 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු. 9,500,000 ක ප්‍රතිලාභ මගින් මිලදී ගෙන තිබුණු ඉඩම් සහ නිවාස වල අයිතිය එම ප්‍රතිලාභීන් නමට නොවීය.. | | |
| (ආ) | ආපදා කළමනාකරණ වැඩසටහන යටතේ ආපදාවට ලක් වූ පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා රජය විසින් ලබාදුන් වැලිපැන්න මවුන්ට්පර්ල් ඉඩමේ යෝජිත මාර්ග සකස් කිරීමට සහ පානීය ජලය ලබාදීම සඳහා 2021 දෙසැම්බර් 06 දින මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු රු.900,000 ක ප්‍රතිපාදන මගින් මෙම කාර්යය සිදුකිරීම සඳහා කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව මතුගම ප්‍රාදේශීය සභාව සමග 2021 දෙසැම්බර් 20 දින ගිවිසුම්ගත වී තිබුණි. මෙම කාර්යය ගිවිසුම්ගත වූ පරිදි සිදු නොවූවද මතුගම ප්‍රාදේශීය සභාවේ සභාපති නමින් නිකුත් කරන ලද රු.854,010 ක් වටිනා 2022 පෙබරවාරි 28 දිනැති චෙක්පත එදින සිට මාස 15 ක් ගතවන තුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සන්තකයේ රඳවා තබාගෙන පසුව රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. ලබාදුන් ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට වගකිව යුතු පාර්ශවයන් අපොහොසත් වී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් වෙතින් කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් වූ තොරතුරුවලට අනුව 2024 පෙබරවාරි 27 දිනට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක පවතින ගොඩනැගිලි 65 ක් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට භාවිතා නොකිරීම නිසා දිරාපත් වීමට ලක්වෙමින් පවතින අතර එම ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි 26 ක අයිතිය දේශීය ලේකම් සතුව පවතී. මෙම ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි 19 ක්ම නැවත අලුත්වැඩියා කර නවීකරණය කිරීමෙන් ප්‍රයෝජනවත් කාර්යයකට භාවිතා කල හැකි මට්ටමේ පවතී. ඉතිරි ගොඩනැගිලි 39 වෙනත් බාහිර රාජ්‍ය ආයතන සතුව පවතින අතර ඉන් ගොඩනැගිලි 29 ක්ම අලුත්වැඩියා හෝ නවීකරණයෙන් පසු නැවත භාවිතා කල හැකි මට්ටමේ පවතී. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ප්‍රයෝජනයට ගත හැකි ගොඩනැගිලි සම්බන්ධයෙන් නොපමාව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කම 2023 වර්ෂයේදී තාවකාලික ගොනු 31ක් මත රු.10,292,136 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා තිබුණු අතර අස්ථානගත වූ ගොනු අස්ථානගත වූයේ කවදා ද, කුමන නිලධාරියෙකු භාරයේ තිබියදී ද යනවග හා ඒවා අස්ථානගත වීමට හේතුව අනාවරණය කරගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | විශ්‍රාම ගොනු හා ලේඛන නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෘත්තීය සැලකිල්ලකින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කාලීන බදුකර යටතේ බදු දී තිබූ හෙක්ටයාර 3.6 ක ඉඩමක් වෙනුවෙන් ඇවර කර තිබූ පෞද්ගලික සමාගමකින් රු.1,620,000 ක හිඟ බදු මුදලක් සහ දඩ මුදලද අයවිය යුතුව තිබුණු අතර 2006 නොවැම්බර් 10 දින සිට වූ ඉහත දීර්ඝ කාලීන බදු ගිවිසුමේ කොන්දේසිවලට අනුව බදු ආරම්භක දින සිට වසරක් ඇතුලත එම ඉඩමෙහි තාප විදුලි බලාගාරයක් ඉදිකළ යුතුව තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවකට පසු විපරම් සිදුකර නොතිබුණි. පසු කාලීනව මෙම ඉඩම බදුකරු වූ පුද්ගලික සමාගම විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් සමාගමක් වෙත පවරා තිබුණද මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් දැනුවත් වී නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අයවිය යුතු බදු සම්බන්ධයෙන් සහ ගිවිසුමේ කොන්දේසි සම්බන්ධයෙන් ප්‍රමාණවත් අධීක්ෂණයකින් හා පසු විපරමකින් කටයුතු කළ යුතු අතර ඒලෙස කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් කට්ටි 129 ක පැවරුම් කටයුතු සිදුකිරීමටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව පළාත් පාලන ආයතන වෙතින් පවරාගත යුතු ඉඩම් කට්ටි 10 ක් පවරා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පවරා ගත යුතු සහ පැවරිය යුතු ඉඩම් සම්බන්ධයෙන් කාලීනව කටයුතු කළ යුතුය. |
| (උ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුල වැඩිහිටි දීමනා වශයෙන් ගෙවීමට නියමිත වූ මුදල රු.1,014,815,700 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගෙවාතිබූ මුදල රු. 783,577,000 ක් පමණක් වූයෙන් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැඩිහිටි දීමනා වශයෙන් 2023 වර්ෂය වෙනුවෙන් ගෙවා නොමැතිව ඉතිරි වූ මුදල රු.231,238,700 ක් විය. එම මුදල් වලින් කොපමණ ප්‍රමාණයක් 2024 පෙබරවාරි 29 දින වන විට ගෙවා අවසන් වී ඇත් ද යන්න හා 2023 වර්ෂයේ ගෙවිය යුතු වැඩිහිටි දීමනා වලින් කොපමණ මුදලක් නැවත අධිහාර කර ඇත් ද යන්න විගණනයට වාර්තා නොවීය. | 2023 වර්ෂයේ පෙබරවාරි සිට ජුනි වරින් වර ගෙවීම් ක්‍රමවේද මාරු වීම නිසා ප්‍රතිලාභියා දැඩි අපහසුතාවට ලක් වූ අතර මුදල් ලබා ගන්නේ කුමන කාර්යාලය මගින් ද යන්න එකවර තේරුම් ගැනීම අපහසු වූ බැවින් මුදල් ලබා ගැනීමට නොයෑම හේතුවෙන් මුදල් අධිහාර වූ බව. එමෙන්ම මාසයකට අදාල දීමනා මුදල නිශ්චිත දිනයකදි ගෙවීමට නොහැකි වන බැවින් තැපැල් කාර්යාල තුල මුදල් ඉතිරි වන බව. | වැඩිහිටි දීමනා වෙනුවෙන් ලද ප්‍රතිපාදන උපරිමයෙන් අදාල ප්‍රතිලාභීන් වෙත ලබාදීමට අවශ්‍ය වැඩපිළිවෙල සැකසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 14 තුල සමාලෝචිත වර්ෂයේ ආරම්භයට අනවසරයෙන් අල්ලාගෙන තිබුණු ඉඩම් කට්ටි 6766 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයතුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විසින් ඉඩම් කච්චේරි 137 ක් පවත්වා අනවසර ඉඩම් කැබලි 956 ක් පමණක් නියමානුකූල කර තිබුණි | 2023 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉඩම් කච්චේරි 5 ක්ද, පානදුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 1 ක්ද හා අගලවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 5 ක්ද වශයෙන් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් නියමානුකූල කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර අවසන් කිරිමට ඉදිරියේදි කටයුතු කරන බව. | නියමිත පරිදි ඉඩම් කච්චේරි පැවැත්වීම හා අනවසර ඉඩම් නියමානුකූල කිරීම යාවත්කාලීනව සිදුකළ යුතුය |
| (එ) | ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු දිළිදුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක සමිති 103 ක් ලියාපදිංචිකර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 80 ක් එනම් සියයට 78 ක්ම අක්‍රීයව පැවති බැවින් එදිනට එම සමිතිවල බැංකු ගිණුම්වල ශේෂව පැවති රු.28,323,210 ක මුදලක් ඌන උපයෝජිතව පැවතුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක එකී ක්‍රියාකාරීව පැවති සමිතිවල සාමාජිකයින්හට ලබාදී තිබූ ස්වයංරැකියා ණය අතරින් රු.2,285,874 ක්ද 2023 දෙසැම්බර් 31 දිනට අය නොවූ අක්‍රීය ණය වශයෙන් පැවතුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වැඩසටහන ක්‍රියාත්මක කලයුතුය. |
| (ඒ) | විමධ්‍යගත අයවැය වැඩසටහන - ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන 2017 යටතේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 ජනවාරි 30 දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.1,710,759 ක් වටිනා චෙක්පතක් නිකුත් කර තිබුණද 2022 මාර්තු 28 දින දක්වා වසර 04 කට වැඩි කාලයක් අදාල ව්‍යාපෘතිය ඉටුනොකර එම මුදල මණ්ඩලයේ ගිණුමක රඳවා තබාගෙන පසුව බදු සඳහා රු.223,142 ක මුදලක්ද අයකරගෙන ඉතිරි මුදල් වශයෙන් රු.1,487,617 ක් පමණක් ආපසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා තිබුණු අතර ආරම්භක සැලසුම් සැකසීමේ සහ අධීක්ෂණ අකාර්යක්ෂමතා හේතුවෙන් රජය විසින් විවිධ | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරිම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් වෙතින් කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවයක් ලබාදී යෙදවීමට ලබාදුන් මුදල් රු.1,710,759 ක් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වසර 05කට ආසන්න කාලයක් නිශ්කාර්යව පැවතිණි.

## 4. තිරසාර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු 17 ක් යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී තිරසාර සංවර්ධන අරමුණු අංක 2 හා අංක 9 සඳහා පමණක් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකල අතර ඒවායේ භෞතික ප්‍රගතිය සියයට සියයක් (100%) බව දක්වා තිබුණි. එසේ වුවද මෙම සංවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මැනීම සඳහා ඒ ඒ සංවර්ධන ක්‍රියාකාරකම්වල ජයග්‍රහන දර්ශකවල අපේක්ෂිත ඉලක්කයන් හා වර්ෂයේ එම ඉලක්කයන් ළඟාකර ගැනීම සංඛ්‍යාත්මකව මැනිය හැකි නිශ්චිත දර්ශකයක් ලෙස (KPI) විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉලක්ක ළඟාකර ගැනීමේ කාර්යසාධනය විගණනයට නිශ්චිතව මැනිය නොහැකි විය. | කොවිඩ් වසංගත තත්ත්වය හා රට තුල උද්ගතව වූ ආර්ථික අවපාත තත්ත්වය මත රාජ්‍ය ආයතනවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අඩාල වූ අතර සංවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මැනිම සඳහා ඒ ඒ සංවර්ධන ක්‍රියාකාරකම්වල ඉලක්කයන් ළගා කර ගැනීම සම්බන්ධව ප්‍රගතිය, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන් මඟින් මැනිය හැකි දර්ශකයන් ලෙස නොව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ව්‍යාපෘති සංඛ්‍යාව අනුව යොමු කිරීමට කටයුතු කර ඇති බව.<br>ඉදිරි වර්ෂයේදි දර්ශකවල අපේක්ෂිත ඉලක්කයන් හා වර්ෂයේ ඒම ඉලක්කයන් ළඟාකර ගැනීම සංඛ්‍යාත්මකව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය |

## 5. යහපාලනය

### 5.1 මහජනතාව වෙත සේවා ඉටු කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මහජනතාව වැඩිපුරම පැමිණෙන ආයතනයන් හි වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම හා ඒවා ඉටුකරන ප්‍රමාණය මැනීම සඳහා චක්‍රලේඛ මගින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබා දී තිබුණු උපදෙස් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2023 වර්ෂයේ මහජනතාව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් වැඩිපුරම රාජකාරි ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන සේවාවන් අතරින් වැඩිම ඉල්ලුමක් ඇති සේවාවන් 05 ක් | තෝරාගත් නිර්ණායක 05 න් රජයේ ඉඩම් සඳහා කෙටිකාලීන හා දිගුකාලීන බදු අයකර ගැනීම හා ග්‍රාම නිලධාරී කාර්යාල පරීක්ෂාව යන නිර්ණායක අඩු මහජන සහභාගීත්වයක් දක්වන නිර්ණායකයක් බව | මහජනතාවට වැඩි සේවාවක් ඉටුකළ හැකි නිවැරදි කාර්ය සාධක දර්ශක හඳුනාගත යුතු බව හා අනුමත ඉලක්ක හා ප්‍රගතිය පිළිබද ප්‍රමාණවත් |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන ඒ සඳහා අදාල ඉලක්කයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් ලබාගෙන තිබුණි. ඉහත චක්‍රලේඛයට අනුව පැහැදිලිවම මහජනතාව වැඩිපුරම රාජකාරී ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන සේවාවන් හඳුනාගෙන එයිනුත් වැඩිම ඉල්ලුමක් ඇති සේවාවන්ට ප්‍රමුඛත්වය ලබාදෙන ලෙස දක්වා තිබුණද ඊට නොගැලපෙන ලෙස රජයේ ඉඩම් සඳහා කෙටි කාලීන හා දිගුකාලීන බදු අයකිරීම හා ග්‍රාමනිලධාරී කාර්යාල පරික්ෂාව යනාදිය 2023 වර්ෂයේ කාර්ය සාධක දර්ශකයන් ලෙස හඳුනාගෙන තිබුණි. උක්ත චක්‍රලේඛයට අනුව මහජන සේවා ඉලක්ක ළඟා කරගැනීමේ ප්‍රගතිය කාර්තු වශයෙන් නියමිත දිනට පෙර විගණකාධිපති වෙතද පිටපතක් සහිතව අමාත්‍යංශය වෙත යොමු කර නොතිබුණු අතර, එකී කාර්තු වාර්තාව විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට ද බදුන් වී නොතිබුණි. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපත් කරන ලද කාර්තුමය ප්‍රගති වාර්තාවේ කාර්තුමය ඉලක්ක ලඟාකර ගැනිම සියයට 25 ට වඩා අඩු අවස්ථාවල ඊට බලපාන ලද හේතු හා ඉදිරිකාලය තුල එම ප්‍රගතිය අඩු වූ විට නිවරදි කිරීමට ගන්නා ක්‍රියාමාර්ග ද සඳහන් කර නොතිබුණි. | පිළිගන්නා අතර 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට එම නිර්ණායක අනවසර ඉඩම් සඳහා විධිමත් බලපත්‍ර නිකුත් කිරීම හා අඩු ආදායම්ලාභීන් සඳහා අස්වැසුම ප්‍රතිලාභ ලබා දීම ලෙස සංශෝධනය කිරීම සඳහා ලේකම්, රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කල බව. එම නිර්ණායක 2024 දෙවන කාර්තුවේ සිට ක්‍රියාත්මක කරන බව. කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ස්ථාන මාරු වීම හා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර මාස 06 කට ආසන්න කාලයක් පුරප්පාඩුව පැවතීම නිසාත් පලමු හා දෙවන කාර්තුවල ප්‍රගතිය ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව හා 2024 දෙවන කාර්තුවේ සිට දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටුවේදී අදාළ ඉලක්කයන් ලගා කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තාව සාකච්ඡා කිරීමට කටයුතු කරන බව. | තොරතුරු ඇගයීම් සිදුකල හැකි පරිදි නියමිත කාල වකවානුව තුල කාර්තු ප්‍රගති වාර්තා ඉදිරිපත්කල යුතු අතර එම වාර්තා විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට ද බදුන් විය යුතු ය. |
| (ආ) | කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශයේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/ පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ වැඩසටහන 2023 මැයි 16 දින සිට මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.3,106,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණ ද 2023 නොවැම්බර් 28 විගණිත දින වන විට එක් ප්‍රාදේශීය සභා පෙර පාසලක දරුවන් 43 දෙනෙකු සඳහා උදෑසන ආහාර සැපයීම සඳහා රු.56,760 ක් පමණක් වැය කර තිබුණු අතර, නියමිත වේලාවට අක් මුදල් නොලැබීම නිසා සැපයුම්කරුවන් පෙර පාසල් සඳහා කෑම ලබාදීම ප්‍රතික්ෂේප කර තිබීම හේතුවෙන් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අක් මුදල් ලැබීමේ ප්‍රමාදය හා එක් දරුවෙකුට රු.60 ක මුදලකින් කෑම වේලක් ලබාදීමේ අපහසුව මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදුකළ නොහැකි වූ බව. | යෝජිත හා අනුමත ව්‍යාපෘති නියමිත කාලසීමාව තුල ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොවිඩ් 19 වසංගතයේ බලපෑම, රසායනික පොහොර අර්බුදය සහ වර්තමාන ආර්ථික තත්ත්වය නිසා විශාල වශයෙන් පීඩාවට පත්ව සිටින ගොවි ජනතාවට සෘජුවම හා ක්ෂනිකව ප්‍රතිලාභ ලබාදීමටත් ඔවුන්ගේ ජීවනෝපාය නගාසිටුවීමටත් සහ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා උපකාරී කර ගැනීමටත් ලෝක බැංකු ආධාර යටතේ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CRes MPA) හා ඒකාබද්ධ ජලධාර හා ජල සම්පත් කළමණාකරන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ උපදෙස් ඇතුලත් කරමින් සියළුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත නිකුත් කරන ලද ලිපියට අනුව අනුමත ව්‍යාපෘති මාස 18 තුල අවසන් කල යුතු බැවින් කඩිනමින් ඇස්තමේන්තු සකස් කල යුතු බවත් මූලික විමර්ශන වාර්තා සකස් කිරීමට කටයුතු කරන ලෙසත් දිස්ත්‍රික් ලේකම් විසින් වැඩිදුරටත් උපදෙස් ලබා දී තිබුණ ද මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එලෙස මූලික විමර්ශන වාර්තා (PIR) සකස් කර නොතිබුණි. මෙම ලෝක බැංකු ව්‍යාපෘතිය අදාල කාල සීමාව තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු නියමිත කාල සීමාව තුල වගකිවයුතු බලධාරීන් විසින් ඉටුකර නොතිබීම හේතුවෙන් අදාල ව්‍යාපෘතියෙන් ප්‍රාදේශීයව ලැබිය හැකිව තිබුණු සෘජු හා ක්ෂණික ප්‍රතිලාභ ලබාගැනීමටත් ඒ තුළින් ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම යන අරමුණු ඉටුකර ගැනීමටත් නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය, ක්‍රියාත්මක කළහොත් නිසි කාලයට අවසන් කළ නොහැකි බව නිලධාරින් දන්වා සිටි අතර, ක්‍රියාත්මක කිරීමට නොහැකි බවද දන්වන ලදී. එම හේතුවෙන් මේ සම්බන්ධයෙන් මූලික විමර්ශන වාර්තාවක් (PIR) සකස් නොකරන ලද බව. | විදේශීය මූල්‍ය සහාය ලබන ව්‍යාපෘති නියමිත කාල සීමාව තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු නියමිත කාල සීමාව තුල ඉටුකිරීමට වගකිවයුතු බලධාරීන් විසින් කටයුතු කළ යුතුය. |

## 5.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම තුල කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා සහතික විය යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 පුහුණු සැලැස්ම තුල කාර්යාල කාර්ය සහායකයන් සහ ග්‍රාම නිලධාරීන් සඳහා කිසිදු පුහුණු අවස්ථාවක් සැලසුම් කර නොතිබුණි. | කාර්යාල සේවක සේවයේ නිලධාරින් සඳහා 2023 වර්ෂයේ දී පුහුණු වැඩ සටහන් සැලසුම් කිරීමේදී සිදු වූ අඩු පාඩුව මඟ හරවා ගැනීම පිණිස 2024 මුල් කාර්තුවේදීම දිස්ත්‍රික්කයේ සියළුම කාර්යාල සේවක සේවයේ නිලධාරින් සඳහා දින 2 ක පුහුණු වැඩ මුළුවක් අදියර 2ක් යටතේ සාර්ථකව පවත්වන ලදී. ග්‍රාම නිලධාරින් සඳහා දින කිහිපයක පුහුණු වැඩ සටහන් මෙම කාර්යාලයේ දී පැවැත්වීම ප්‍රායෝගිකව අපහසු කටයුත්තක් බැවින් එම නිලධාරින් සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත මුදා හැර ඇති බව. | මානව සම්පත් සැලැස්ම ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහා ම පුහුණු අවස්ථා සහතික වන පරිදි පුහුණු සැලැස්ම සැකසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කාර්යාල අටක (08) සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති තනතුරු පුරප්පාඩු 94 ක් සම්පූර්ණ කර නොතිබුණි. | ග්‍රාම නිලධාරි පුරප්පාඩු පවතින අතර ඉදිරි බඳවා ගැනීම් වලදී එම පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරෙන බව. මේ හැරුණු විට පවතින කළමනාකරණ සේවා නිලධාරි පුරප්පාඩු වලට අදාළ කාර්යයන් අතිරික්ත සංවර්ධන නිලධාරින් මඟින් ඉටු කරවා ගන්නා බව. | අනුමත කාර්ය මණ්ඩලයට අනුකූල වන පරිදි තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |
| (ඇ) | ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වන බව දක්වා තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් 2023 දෙසැම්බර් 31 දිනට සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් 210 කු සේවයේ යොදවා තිබුණි. | 2024 අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු වීම් යටතේ සංවර්ධන නිලධාරී සේවය, කළමනාකරණ සේවා නිලධාරි සේවය, ඒකාබද්ධ රියදුරු සේවය, කාර්යාල සේවක සේවය, යන සේවාවන් හි වසර 5 කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරින් වැඩි ප්‍රමාණයක් සේවා අවශ්‍යතාව, නිලධාරින්ගේ ඉල්ලීම් සහ එකම ස්ථානයක සේවා කාලය යන කරුණු සැලකිල්ලට ගෙන ස්ථාන මාරු කොට එම ස්ථාන මාරු වීම් මේ වන විට ක්‍රියාත්මක කොට තිබෙන බව. තව දුරටත් 2025 වර්ෂය තුළ වැඩි සේවා කාලයක් සහිත නිලධාරින් ස්ථාන මාරු කිරීමට අදාළව කටයුතු කරන බව. | ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව මාරු වීම් සිදුකළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහොමයක අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් සේවයේ යොදවා සිටි අතර නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අටක (08) හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පමණක් එලෙස අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා සිටි අතිරික්ත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව 99 ක් විය. | රජ්‍ය පරිපාලන අමාත්‍යංශයෙන් ලද උපදෙස් මත කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පුහුණුව සඳහා උපාධිධරීන් අනුයුක්ත කරන ලද බව. වරින් වර ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලද අතර එහිදී අනුයුක්ත කල නිලධාරීන් අතුරින් අතිරික්ත නිලධාරීන් 99 දෙනෙකු සිටියද මේ වන විට ඒ නිලධාරීන් සියළුදෙනා හට විධිමත් පරිදි රාජකාරි පවරා ඔවුන් විසින් එම රාජකාරි කටයුතු ඉටු කරනු ලබන බව. | අනුමත කාර්ය මණ්ඩලයට අනුකූලව තනතුරු පවත්වාගෙන යායුතු අතර, නැතහොත් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගත යුතුය. |